# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
## வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம்
## DEPARTMENT OF WILDLIFE CONSERVATION

ප්‍රධාන කාර්යාලය - අංක 811 - ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල 10120
பிரதான அலுவலகம், இல. 811 - ஏ, ஜயந்திபுர வீதி, பத்தரமுல்லை 10120
Head Office – No. 811 - A, Jayanthipura Road, Battaramulla 10120


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | WL/12/01/01/220 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.12. 29 |

<u>මාධ්‍ය නිවේදනය</u>

සියළුම මාධ්‍ය ආයතන වෙත,

රුහුණු (යාල) ජාතික උද්‍යානය තුලට සංචාරක කණ්ඩායම් ප්‍රවාහනය කරන සෆාරි ජීප් රථ රියදුරන්ට රුහුණු (යාල) ජාතික උද්‍යානයතුල සංචාරක කටයුතු සිදු කිරීම පිළිබඳව පුහුණුවක් ලබාදෙන ලදී.

මෙම පුහුණුව ලබාදීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය ඒකාබද්ධව ක්‍රියාකරන ලදී. එම පුහුණුව යටතේ සෆාරි ජීප්රථ රියදුරන් 700 ක් පමණ පුහුණු කිරීමට කටයුතු කරන ලදී.

රුහුණු (යාල) ජාතික උද්‍යානයේ සංචාරක සේවා වල ගුණාත්මකභාවය ඉහල නැංවීමේ අරමුණින් ඉහත කී පුහුණුවෙන් අනතුරුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට අදාල පාර්ශ්වකාර ආයතන වල එකඟතාවය සහිතව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇත.

1. 2024 වර්ෂයේ ජනවාරි 1 වන දින සිට රුහුණු (යාල) ජාතික උද්‍යානයේ සංචාරක කටයුතු සඳහා ඇතුල්වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සෆාරි ජීප්රථවල රියදුරන් ඉහත කී පුහුණුව ලබා ඇත්නම් එම සෆාරි ජීප් රථවලට මාර්ගෝපදේශකයකු රහිතව, බලපත්‍ර ලබාගැනීමෙන් අනතුරුව උද්‍යානයට ප්‍රවේශවීමට අවසර ලබාදීම.

2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සෆාරි ජීප් රථයකින් සංචාරක කණ්ඩායමක් රැගෙන යන රියදුරෙකු අදාල පුහුණුව ලබාගෙන නොමැති නම් එම කණ්ඩායමට ජාතික උද්‍යානය තුලට ප්‍රවේශ බලපත්‍ර ලබාගෙන පිවිසීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන මාර්ගෝපදේශකයෙකුගේ සේවය ලබාගැනීම අනිවාර්ය කිරීම.

3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සෆාරි ජීප් රථයක් නොවන වෙනත් අවසරලත් කාණ්ඩයක වාහනයකින් සංචාරක කණ්ඩායමක් ජාතික උද්‍යාන තුලට ප්‍රවේශ බලපත්‍ර ලබාගෙන පිවිසීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන මාර්ගෝපදේශකයෙකුගේ සේවය ලබා ගැනීම අනිවාර්යය කිරීම.

එම්.ජී.සී.සූරියබණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්


| | | |
|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | අධ්‍යක්ෂ ජනරාල් | - 011 2888581 |
| | අධ්‍යක්ෂ (පාලන) | - 011 2888583 |
| | අධ්‍යක්ෂ (මෙහෙයුම්) | - 011 2888582 |
| | අධ්‍යක්ෂ (වනජීවී සෞඛ්‍ය) | - 011 2871535 |
| | අධ්‍යක්ෂ (මුදල්) | - 011 2888584 |

ප්‍රධාන කාර්යාලය / அலுவலகம் / Head Office: 011 2888585
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2883355
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: dg@dwc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.dwc.gov.lk